Article 12
12 (1)
14 (1) (2)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 10.12.2020

පෙත්සම්කාර පාර්ශවය : දසනායක කන්කානමලාගේ පියරත්න දසනායක මයා,
13 F -1, හොරණ පාර,
කැස්බෑව.

වගඋත්තරකරුවන් : 01. නාවික හමුදාපති
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
කොළඹ.

02. ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය,
අංක 15/5, බාලදක්ෂ මාවත,
කොළඹ 03.

පැමිණිලි අංකය : **HRC/2314/15**

ඉහත නම් සඳහන් පෙත්සම්කරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ ගොනුකළ පෙත්සමට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් කරමින් පහත සඳහන් නිර්දේශය නිකුත් කරනු ලබන බව මින් දන්වා සිටිමු.

පෙත්සම තුළින් දක්වා ඇති කරුණු =:

ශ්‍රී ලංකා නාවික හමුදාවේ රියර් අද්මිරාල් තනතුරේ දැනට කටයුතු කරනු ලබන පෙත්සම්කරු තම පෙත්සම ගොනු කරනු ලබන අවස්ථාවේ කපිතාන් නිලයේ කටයුතු කරමින් සිටියදී දක්වා සිටින ලද්දේ කොමදෝරු නිලය දක්වා උසස්වීමට ඇති අවස්ථාව අහිමි කර තිබීමෙන් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවය. තම පෙත්සම 2015.07.02 දින කොමිෂන් සභාවේ ලියාපදිංචිකරමින් එහි X දරණ ලේඛනය තුළින් වැඩිමනක් කරුණු සවිස්තරාත්මකව දක්වා ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව දක්වා ඇත්තේ, 2015.06.03 දින නාවික හමුදාපති විසින් නිකුත් කරන ලද "දින කාලසණිය 031602 ජූනි 2015" දරණ සංඥාව ප්‍රකාරව නාවික නිලධාරින් 13 දෙනෙකු කපිතාන් නිලයේ සිට තාවකාලිව කොමදෝරු නිලයට උසස් කළද පෙත්සම්කරුට හිමිවිය යුතු උසස්වීම අහිමි කර ඇති බවය.

පෙත්සම්කරු 2014 ජ්‍යෙෂ්ඨතා ලේඛනයට අනුව 87 වන ස්ථානයේ සිටි බවද උසස්වීම් ලබාදුන් කපිතාන්වරු අතර ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ 88, 89, 92, 96, 97 දරණ ස්ථානගත අයද සිටින බව එකී නිලධාරින්ගේ නම්ද සහිතව පෙත්සම්කරු කරුණු දක්වා ඇත. පෙත්සම්කරුට වඩා ජ්‍යෙෂ්ඨත්වයෙන් අඩු නිලධාරින් 05 දෙනෙකුද කොමදෝරු නිලය දක්වා උසස් කර තම ජ්‍යෙෂ්ඨත්වය සහ දක්ෂතාවය මත හිමිවිය යුතුව තිබූ උසස්වීම අහිමි කර තිබීමෙන් වූ අසාධාරණය හා මානසික පීඩනය පිළිබඳ දක්වා ඉහත නම්කළ වගඋත්තරකරුවන් දෙදෙනාටම අභියාචනයක් ඉදිරිපත් කළද පෙත්සම ගොනු කරන දින වනතුරු සහනයක් හෝ එකී උසස්වීම අහිමිකිරීමට හේතු වාර්තා නොකල බවද දක්වා ඇත. එහෙත් නාවික හමුදාපති විසින් වාචිකව පෙත්සම්කරුට දක්වා ඇත්තේ, හිටපු නාවික හමුදාපති වූ අද්මිරාල් කරන්නාගොඩ මහතා විසින් නාවික හමුදා නිලධාරියකු වූ සම්පත් මුණසිංහ නම් අයහට එරෙහිව 2009 ජූනි මස ශ්‍රී ලංකා පොලිසිය වෙත කළ පැමිණිල්ලකට අදාලව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් සිදු කරමින් තිබීම මත පෙත්සම්කරුට හිමි උසස්වීම අත්හිටුවන ලද බවය. එහෙත් එම පරීක්ෂණයට පෙත්සම්කරුගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවද ඊට අදාල නඩුකටයුත්තේ පෙත්සම්කරු විත්තිකරුවකු හෝ චූදිතයකු නොවූ බවද 2009 වසරේ සිට පරීක්ෂණ කටයුතු වසර 06 පමණ (පෙත්සම කොමිෂන් සභාවේ ගොනුකර දින දක්වා) සිදු කරමින් පැමිණි බවද තවදුරටත් ඉදිරියටද සිදු කරනු ලබන බවද නිශ්චිත අවසානයක් නොපෙනෙන බවද තමාට උසස්වීම අහිමිකර තිබියදීම විශ්‍රාම ගන්නා තුරුද බලා සිටීමට සිදුවිය හැකි බවද පෙත්සමෙන් දක්වා ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉහත නම් සඳහන් කළ නාවික නිලධාරියාට එරෙහිව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ ගොනුකළ බී 732/2009 දරණ නඩුවේදී පෙත්සම්කාර තමා එකී නඩුවේ සාක්ෂිකරුවකු බවද නඩුවේ හෙළිවන කරුණු අනුව ඒවායේ සත්‍ය අසත්‍යතාවය දැන ගැනීමට අවශ්‍ය පාර්ශවයක් පමණක් බව අධිකරණයට දක්වා ඇති බවයි.

නාවික හමුදාවේ රෙගුලාසියක්ව තිබී ඇත්තේ, නිලධාරියකුට විරුද්ධව නඩු කටයුත්තක් පැවතියද හිමිවියයුතු උසස්වීමක් ලබාදිය යුතු බවද ඒ අනුව උසස්වීම් ලබාදුන් නිලධාරින්ගේ නම්ද තම පෙත්සමේ සඳහන් කරන පෙත්සම්කරු වැඩිදුරටත් දක්වා ඇත්තේ, එකී නඩුවල ඔවුන් විත්තිකරුවන් වුවද හිමි උසස්වීම් ලබා දී ඇතත්, බී 732/2009 දරණ නඩුවේ සාක්ෂිකරුවකුව සිටින තමාට හිමි වියයුතු උසස්වීම අහිමිකර තමාට වඩා ජ්‍යෙෂ්ඨතාවයෙන් පහළ නිලධාරින් පවා උසස්කිරීම සිදුකර ඇති බවත් ඉන් තම ජ්‍යෙෂ්ඨතාවයද තවදුරටත්

පහලට සටහන් වන බවත්ය. එබැවින් නාවික හමුදාපති විසින් දක්ෂතාවය සහ ජ්‍යෙෂ්ඨතාවය මත හිමිවිය යුතු උසස්වීම ලබා දිමේදී කටයුතු කර ඇති ආකාරය අනුව පවතින නීතිරීති රෙගුලාසි වලින් පරිබාහිරව කටයුතු කර තමාට වෙනස්කොට සැලකීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12(1) සහ 14(1) (උ) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇති බව දක්වා ඇත.

පෙත්සම්කරු පෙත්සමට අදාල කරුණු තහවුරු කිරිමට වැඩිමනක් ලේඛන ලෙස පහත සඳහන් ඇමුණුම් පෙත්සමට යා කර ඇත.

| | | |
|---|---|---|
| X 1 | - | The Navy List 2014<br>(Containing seniority and personal data of all officers of the Regular volunteer and Reserve List) |
| X 2 | - | කැප්ටන් නිලයේ සිට කොමදෝරු නිලය දක්වා උසස් කිරිම් සිදුකළ 2015 වසරේ අදාල 13 දෙනෙකුගේ නාම ලේඛනය. |
| X 3 | - | නාවික හමුදාපති වෙත 2015.03.23 පෙත්සම්කරු ඉදිරිපත් කළ අභියාචනය |
| X 4 | - | ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කළ අභියාචනය |
| X 5 | - | ආරක්ෂක අමාත්‍යාංශය විසින් පෙත්සම්කරු හට ආරක්ෂක ලේකම් වෙත යොමුවීමට කළ දැන්වීම |
| X 6 | - | ආරක්ෂක ලේකම් වෙත ඉදිරිපත් වූ පසු ලබා දිමට සකසන ලද ලිඛිත අභියාචනය |
| X 7 | - | B 732/09 දරණ නඩුවේ පිටපත |
| X 8 | - | 2015.06.03 දින නාවික හමුදාපති වෙත ඉදිරිපත් කළ අභියාචනය |

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම =:

2016 ක් වූ ජූලි මස 24 වන දින තම අංක LGL/05/07/2016 යටතේ නාවික හමුදාපති වෙනුවෙන් අදාල කරුණු දැක්වීම ලිඛිතව වාර්තාවක් මගින් කොමිෂන් සභාව වෙත ලබා දි ඇත.

ඒ අනුව දක්වා ඇත්තේ, 2016.07.02 සහ 2016.07.25 දින කොමිෂන් සභාව විසින් කළ විමසීමට අනුව කරුණු දක්වන බවත් බී 732/09 දරණ නඩුව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වන බවත් එය නාවික හමුදා සේවයෙන් ඉවත් කළ ලුතිනන් කොමාන්ඩර් එම්.ජී.ඩී.එස්. මුණසිංහ නම් නිලධාරියාට විරුද්ධව පුද්ගලයින් පැහැර ගැනීමක් සම්බන්ධව පවතින බවත්ය. පෙත්සම්කරු එම නඩුවේ පරික්ෂණ කටයුත්තක් සඳහා ප්‍රකාශයක් ලබා

ගැනීමට අවශ්‍ය වූ බැවින් ඇමරිකා එක්සත් ජනපදයේ නාවික පාඨමාලාවකට පිවිස සිටියදී 2015.02.28 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලංකාවට ගෙන්වාගන්නා ලද බවද දක්වා ඇත. අදාල ප්‍රකාශය ලබාගත් පසු නැවත එකී පාඨමාලාව සඳහා යාමට අවසර ලබා නොදුන් බවද සඳහන් කර ඇත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අධිකරණයට කරුණු දක්වා ගුවන්ගමන් බලපත්‍රයද තහනමට ගත් බව දක්වා ඇත.

නාවික හමුදාවේ උසස්වීම් ලබාදීමේදී උසස්වීම් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබෙන සියලු සුදුසුකම්ලාභින් සම්මුඛ පරීක්ෂණයට භාජනය කර විවිධ නිර්ණායක යටතේ ලකුණු ලබා දී ඒ අනුව ඉහලම ලකුණු ලබාගන්නා නිලධාරීන් හට පුරප්පාඩු මත පිළිවෙලින් උසස්වීම් පිළිගන්වන බවද දක්වා ඇති අතර, පෙත්සම්කරු ඉහලම ලකුණු ලබා තිබුනද උසස්වීම ලබාදීමට පෙර නිසි බලධාරීන් වෙතින් විමසා උපදෙස් පැතීමට නාවික හමුදාව තීරණය කල බව දක්වා ඇත. මෙම සම්මුඛ පරීක්ෂණ වලදී ඉහල ලකුණු ලද අනෙක් නිලධාරීන් හට වෙනත් බාධාවක් නොවූ බැවින් උසස්වීම් පිළිගන්නවන ලද බවද වැඩිදුරටත් වාර්තා කර ඇත.

2016.04.30 දින නාවික හමුදාවෙහි මාණ්ඩලික ප්‍රධානි විසින් නීතිපති වෙතින් පෙත්සම්කරුගේ උසස්වීමට අදාලව උපදෙස් ඉල්ලා සිටි බවද 2016.06.16 දින නැවත නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දක්වමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කරන ලෙසද නැතිනම් මෙම පෙත්සම්කරුට දැඩි අප්‍රතිකාරි අගතියක් සිදුවිය හැකි බවද දන්වා තිබූ බව ප්‍රකාශ කර ඇත. එමෙන්ම 2016.07.15 දින නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානි විසින් නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත දක්වා ඇත්තේ, මෙම නිලධාරියාට අදාල උසස්වීම ලබාදීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විරෝධතාවයක් තිබේද යන්න දක්වන ලෙසය. එහිදී එම අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාල උසස්වීම පෙත්සම්කරුට හිමිකර දීම එම විමර්ශනයට බාධාවක් නැති බවද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂණ කටයුතු තවදුරටත් පවතින බවද දක්වා ඇත. ඒ අනුව නැවත නාවික හමුදාපති විසින් 2016.07.08 දින මේ පිළිබඳ කරුණු දක්වා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් විමසා ඇති අතර, ඊට පිළිතුරු නොලද බැවින් 2016.08.18 දින නැවතත් ලිඛිතව විමසීමක් සිදුකර තිබී ඇත. එමෙන්ම නීතිපති වෙතින් කරන ලද විමසීමට අනුව නාවික හමුදාපති වෙත මෙතෙක් පිළිතුරක් නොලද බවද වාර්තාවෙන් දක්වා ඇත.

පෙත්සම්කරු තම පෙත්සමෙන් දක්වා ඇති පරිදි අධිකරණයේ නඩු කටයුතු පැවතියදී විත්තිකරුවන් ලෙස නමකර තිබූ නිලධාරීන්ටද උසස්වීම් ලබා දී තිබීම සම්බන්ධව දක්වා ඇත්තේ, එක් අයකු වන ලුතිනන් කමාන්ඩර් ඩබ්.ආර්.එස්. හරිස්චන්ද්‍ර යන අයට එරෙහිව අනුරාධපුර මහාධිකරණයේ HC 350/2004 දරණ නඩුව පවරා තිබූ බවද ඒ අනුව ඔහුට හිමි උසස්වීම ලබාදීම ප්‍රමාද කල බවද දීර්ඝ කාලයක් නඩුව අවසන් නොවී තිබීම මත උසස්වීම

ලබා දීමට නාවික අධ්‍යයන මණ්ඩලය කමිටුවක් විසින් නිර්දේශ කර තිබූ බවය. ඒ අනුව අදාල උසස්වීම ලබා දුන් බවද එම නිලධාරියා චෝදනා පත්‍රය ඉල්ලා අස්කර ගැනීම මත 2009.08.24 දින නිදහස් කර ඇති බවද 2008.03.02 දින සිට බලපැවැත්වෙන පරිදි 2010.03.11 දින සිට උසස් කර ඇති බවද දක්වා ඇත.

තවද කොමාන්ඩර් S.P.N.K.ඩෙන්සන් යන අයහට එරෙහිවද අනුරාධපුර මහාධිකරණයේ HR 53/2006 යටතේ නඩුවක් පවරා තිබූ බවද එම චෝදනා පත්‍රයද ඉල්ලා අස්කර ගැනීම මත 2009.02.16 දින නඩුවෙන් නිදහස් කර ඇති බවද දක්වා ඇත. එහෙත් ලුතිනන් කොමාන්ඩර් නිලය 2007.08.25 දින නඩුව පවතින වාරයේ උසස්වීමක් ලෙස ලබාදුන් බව පිළිගෙන තිබේ.

පෙත්සම්කරුට හිමි උසස්වීම ප්‍රමාද වී ඇත්තේ නාවික හමුදාවට පාලනය කරගත නොහැකි බාහිර හේතු මත බවද නීතිපති හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නාවික හමුදාව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බවද දක්වා ඇති අතර, පෙත්සම්කරුට හිමි උසස්වීම අත්හිටුවා පුරප්පාඩුව වෙන්කර තබා ඇති බවද ප්‍රකාශ කර ඇත.

පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු -:

මෙම පෙත්සමට අදාල පරීක්ෂණ දිනයන්හිදී පහත සදහන් කරුණු වාර්තා වී තිබේ.

2016.11.10 දින පරීක්ෂණ අවස්ථාව වන විට පෙත්සම්කරුට තාවකාලිකව කොමදෝරු නිලයට හිමි උසස්වීම ලැබී තිබුනද නියමිත දිනට අන්තර්ග්‍රහනය කර නැති බව පෙන්වා දෙන ලදි. 2012 වසරේ සිට ඒ සදහා සුදුසුකම් ලබා තිබුනද 2014 වසරේ ජූලි මස හෝ ආසන්න දිනක පැවති පුරප්පාඩු මත ඉදිරිපත්ව වඩාත්ම සුදුසුකම් ලද අය බවට පත්ව තිබියදී එය නියමිත දිනට හිමිකර නොදුන් බව පෙත්සම්කරු කියා සිටින ලදි.

වගඋත්තරකරු කියා සිටින ලද්දේ පෙත්සම්කරුගේ ඉල්ලීම් පිළිබඳ කොමිෂන් සභාව විසින් ලිඛිතව නාවික හමුදාව වෙත වාර්තා කල පසු සුදුසු අංශ වෙත දක්වා එහිදී ගන්නා පියවර නැවත පරීක්ෂණ දිනකදී කියා සිටින බවය.

මෙහිදී පෙත්සම්කරුද ඊට එකග වූ පසු නියමිතව තිබුනේ පෙත්සම්කරුට හිමි උසස්වීම නියමිත සුදුසු දිනට අන්තර්ග්‍රහනය කිරීමට කරනු ලබන ඉල්ලීමද, පෙත්සම්කරුට අහිමි වී ගිය විදේශීය නාවික පාඨමාලාව (N.D.C. හෝ ඊට අදාල සමාන පාඨමාලාව) නැවත ලබා දීමද, 2009 වසරේ ක්‍රියාත්මක රාජකාරියේදී දක්වන ලද විශේෂතා දැක්වූ නිලධාරීන් 71 දෙනෙකුගේ නාම ලේඛනය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් හා නාවික හමුදාපති (හිටපු) විසින් සකස් කර තිබියදී ඊට පෙත්සම්කරුගේ නමද ඇතුලත්ව ඇතත්, එය නියමිත දිනට ලබා

දී නොතිබීම පිළිබඳ සොයා බලා එම උසස්වීම නියමිත දිනට ගැලපීම සිදුකර දීමද යන කරුණු 03 ට අදාළව නාවික හමුදාව වෙතින් ලිඛිතව වාර්තාවක් ලබා ගැනීම වේ.

2017.05.22 වන දින දෙවන වරට පරීක්ෂණය සිදු කරන ලද අතර පෙත්සම්කරුට ඉදිරිපත්වීමට නොහැකිව තිබූ බැවින් වගඋත්තරකරුට දන්වා නැවත පරීක්ෂණය සිදුකිරීමට තීරණය විය.

2017.05.26 දින නාවික හමුදාපති වෙත ලිඛිතව දන්වා සිටින ලද්දේ පෙත්සම්කරු විසින් සහන ලෙස ලබා දෙන ලෙස ඉල්ලා සිටි මුල් පරීක්ෂණ දින දක්වා සිටි කරුණු 03 ට අදාළව ගත හැකි පියවර පිළිබඳ 2017.06.10 දිනට පෙර කරුණු දක්වා සිටින ලෙසය. එකී වාර්තාව නියමිත දිනට නොලද බැවින් නැවත එම දැන්වීම නාවික හමුදාපති වෙත යොමු කරමින් අදාළ වාර්තාව 2017.07.03 දිනට පෙර ලබා දෙන ලෙස දන්වා ඇත.

2017.07.14 දිනට පරීක්ෂණයට සිතාසි නිකුත් කළ පසු මෙම ගොනුවේ ඇති සියලු කරුණු සලකා බලා තවදුරටත් කරුණු විමසීම සඳහා අද්මිරාල් W.K.J.කරන්නාගොඩ (විශ්‍රාමික) සහ අද්මිරාල් T.S.G.සමරසිංහ (විශ්‍රාමික) යන අයහට ස්වාධීනව ඉදිරිපත්ව කරුණු දැක්වීමට කැමැත්තක් දක්වන්නේ නම් ඉදිරිපත්වීමට දන්වා ඇත.

2017.06.12 දින නාවික හමුදාව වෙතින් ඉල්ලා සිටින වාර්තාව ඉදිරි දින 14 ක් තුළ ලබා දීමට පියවර ගන්නා බව දන්වා ඇත. එමෙන්ම පෙත්සමේ සඳහන් කාරණාවක් වූ ක්‍රියාත්මක රාජකාරියේ යෙදී සිටි 71 දෙනෙකුගේ නිර්දේශිත (පෙත්සම්කරුටද අදාළ වන) උසස්වීම ලබා දී නොතිබීම විමසීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙතද ඉදිරි පරීක්ෂණ දින ඉදිරිපත් වන ලෙස දන්වා සිටි අතර ඉදිරි පරීක්ෂණ දින වගකීමකින් යුතුව කරුණු දැක්විය හැකි නිලධාරීන් නාවික හමුදාපති වෙනුවට ඉදිරිපත් වීම සුදුසු බවද දක්වා ඇත.

2017.07 14 වන දින පරීක්ෂණයට සිතාසි යොමුකර තිබියදී පෙත්සම්කරු ඊට ආසන්න දිනක සිට වැලිසර නාවික හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගන්නා බැවින් ඔහුට ඉදිරිපත්ව කරුණු දැක්වීමට වෙනත් දිනයක් ඉල්ලා ඇත. 2017.07.10 දිනදී නාවික හමුදාපති වෙතින් ඉල්ලා සිටි වාර්තාව කොමිෂන් සභාව වෙත ලබා දී ඇත.

ඒ අනුව ඉන් දක්වා ඇත්තේ, නාවික හමුදා පාඨමාලාවක් සඳහා (N.D.C) ඉදිරිපත් වූ අයකු අදාළ පාඨමාලාව අවසන්ව පැමිණ පසු තවදුරටත් වසර 03 ක් ඉදිරියට නාවික හමුදාවේ සේවය කළ යුතු බවද නාවික හමුදාවේ විශ්‍රාමික වයස සීමාව අවුරුදු 55 ලෙස සලකන බැවින් මෙම අවස්ථාවේදී පෙත්සම්කරුගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීම 2021.02.16 දිනට යෙදී ඇති බැවින් අවුරුදු 03 ක් සේවය කිරීමට ඇති ඉදිරි කාලය පිළිබඳ ගැටලුව මතුවන

බැවින් එකී පාඨමාලාවන්ට අදාල නීතිරීති අනුව ඉටුකල නොහැකි එකක් බවය. තවත් පාඨමාලාවක් ඕස්ට්‍රේලියානු රජය විසින් ප්‍රදානය කර තිබූ බැවින් එයද ලබා දීමට සලකා බලන ලද නමුත් විදේශීය පාඨමාලා සඳහා ඉදිරිපත් කරන්නන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ 15 වන පරිච්ඡේදයේ 4 වන අනුපරිච්ඡේදයේ 4:3:1 ජේදය ප්‍රකාරව වයස අවුරුදු 55 සම්පූර්ණවීමට පෙර යලි ඔහු සේවය කල යුතු කාලය සලකා බැලීමට වගබලා ගතයුතුව තිබීමේ නීතිරීති බාධාවක්ව පැවති බවය. මෙම පාඨමාලාවක් ආසන්න වශයෙන් වසරක් වන අතර ආයතන සංග්‍රහයේ 4:4 අනුජේදය ප්‍රකාරව පාඨමාලාවෙන් අනතුරුව අනිවාර්ය සේවා කාලය පාඨමාලාවේ කාලය මෙන් හතර ගුණයක් විය යුතු බවට දක්වා ඇති බවද පෙන්වා දී ඇත. ඒ අනුව පෙත්සම්කරුට N.D.C.පාඨමාලාවක් සඳහා ඇති අවස්ථාව ලබාදීමේ හැකියාවක් නොමැති බව දක්වා තිබීමෙන් පෙත්සම්කරුට එකී සහනය ලබා ගැනීමට ඇති අවස්ථාවද අහිමිවන බව ප්‍රකාශ කර ඇත.

තවද 2017.07.14 දින පැවැත්වීමට නියමිත පරීක්ෂණයට ආරක්ෂක අමාත්‍යාංශයටද නොවැලැක්විය හැකි හේතුවක් මත ඉදිරිපත්වීමට නොහැකි බවද ලිඛිතව දන්වා තිබූ අතර. වෙනත් දිනයක් ලබා දෙන ලෙසද ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වෙනුවට දන්වා තිබිණ.

2017.07.14 දින පරීක්ෂණ අවස්ථාවට ඉදිරිපත්ව කරුණු දැක්වීමට හිටපු නාවික හමුදාපති අද්මිරාල් W.K.J.කරන්නාගොඩ මහතා පැමිණ තිබූ අතර වගඋත්තරකාර නාවික හමුදාපති වෙනුවට ලුතිනන් අනිල් දනන්සූරිය මහතා පෙනී සිටින ලදී. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට ඉදිරි දිනයක් ඉල්ලා තිබූ ලිපියට අනුවද පෙත්සම්කරු වැලිසර නාවික හමුදා රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ගැනීම වාර්තා කර තිබීමද මත එකී දෙපාර්ශවය ඉදිරිපත්ව නොසිටියදී පරීක්ෂණය සිදු කර ඇත.

මෙම පරීක්ෂණ දින නාවික හමුදාව වෙනුවෙන් පැමිණි නිලධාරි විසින් ප්‍රකාශ කර ඇත්තේ. පෙත්සම්කරුට N.D.C.පාඨමාලාව සඳහා ඇති අවස්ථාව අහිමි වූයේ ඔහු ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ 08 වන ස්ථානයට පත්ව සිටි හෙයින් බවයි. මෙහිදී හිටපු නාවික හමුදාපති අද්මිරාල් කරන්නාගොඩ මහතා ප්‍රකාශ කර ඇත්තේ. ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ පලමු තැනට පත්ව සිටි පෙත්සම්කරු ඇමෙරිකා එක්සත් ජනපදයේ පුහුණු පාඨමාලාවක් සඳහා ඉදිරිපත්ව සිටියදී නැවත පාඨමාලාවද අතරමැද නවතා ලංකාවට ගෙන්වාගත් පසු ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ 08 වන ස්ථානයට පත්වූයේ කෙසේද යන්න පිළිබඳ උත්තර දෙන ලෙසය. එමෙන්ම නාවික හමුදාව විසින් මෙම පෙත්සම්කරුගේ විදේශීය පුහුණු පාඨමාලාවද අතරමැද නවතා දමා ලංකාවට කැඳවා ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ 08 වන ස්ථානයට පහල හෙළීමෙන් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ පලමු තැනට පත්ව තිබූ අවස්ථාව අහිමිකර ඉතාමත් බරපතල අසාධාරණයක් සිදුකර ඇති බවය. එබැවින් මෙම පරීක්ෂණ දින එකී කරුණු තහවුරු කර පලමු ස්ථානයේ සිටි පෙත්සම්කරු 08 වන ස්ථානයට පත්ව ඇත්තේ කෙලෙසද යන්න තහවුරු කරන ලෙසද

ජ්‍යෂ්ඨතා ලේඛනයේ පලමු තැනට පත්ව ඇති බවට නාවික හමුදාව සතු ලේඛනද ඉදිරිපත් කරන ලෙසද දක්වා ඇත. වගඋත්තරකරු සතුව එම ලේඛන එම අවස්ථාවේ නොතිබූ බැවින් පසු අවස්ථාවක් ඒ සඳහා ඉල්ලා ඇත.

වැඩිදුරටත් කරුණු දක්වා සිටි හිටපු නාවික හමුදාපති විසින් ප්‍රකාශ කර ඇත්තේ, එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදී කටයුතු පැවැතියදී ඉතා දක්ෂ ලෙස ක්‍රියාත්වීත රාජකාරියේ යෙදී සිටි නිලධාරියකු බවද ත්‍රස්තවාදී කටයුතු අවසන් කිරීමට නාවික හමුදාවට තම උපරිම බලය ශක්තිය යොදන ලද අවස්ථාවේ සිටි ප්‍රධානතම නිලධාරින් අතරින් එක් අයකු බවද එබැවින් රණශූර පදක්කම පවා ලද නිලධාරියකු බවය. නාවික හමුදාවට බැදුනු දින සිට මෙදින දක්වා සියලු කරුණුද ප්‍රථම පෙල සියලු සාමාජිකයන්ද සලකා බැලීමේදී පෙත්සම්කරුට විශාල අසාධාරණයක් පෙත්සම්කරුට සිදුව ඇති බවද දක්වා ඇත. අවශ්‍ය නම් කොමිෂන් සභාව හමුවේ තවදුරටත් කරුණු දැක්විය හැකි බවටද සඳහන් කරමින් දීර්ඝ කරුණු දැක්වීමක් සිදු කර ඇත.

පෙත්සම්කරු වෙනුවෙන් පෙත්සම්කරුගේ බිරිද ඉදිරිපත්ව මෙම පරීක්ෂණ දිනට පෙර දන්වා ඇත්තේ කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වමින් ඉල්ලා ඇති උසස්වීමටද බාධාවක් වන පරිදි පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීමට කටයුතු කරන බවද අධිකරණ නියෝගයක් ගැනීමට බි 732/09 නඩුව ඊට භාවිතා කරන බවද දැනගන්නට ලැබී ඇති බවයි. එහෙත් මෙම පරීක්ෂණ දින වන විට පෙත්සම්කරු බන්ධනාගාර ගත කල බවද අනාවරණය වේ.

2018.08.17 දින නැවත ද වැඩිදුර කරුණු විමසා නාවික හමුදා මූලස්ථානය වෙතින් වාර්තාවක් ලබාදෙන ලෙසද එය 2018.08.31 දිනට පෙර ලබාදෙන ලෙසද දන්වා තිබිණ. ඉන්ද පෙත්සම්කරුගේ ජ්‍යෂ්ඨතා සහ ඊට අදාල ලකුණු වාර්තාද කොමදෝරු නිලය තාවකාලිකව දීර්ඝකාලයක් තැබීමට හේතු හා අධිකණයේ නඩු කටයුතු ආදී කරුණු විමසා කරන ලද විමසීමකි.

2018.04.24 දිනද ඉහත හේතු මත නැවත පරීක්ෂණ කටයුතු සිදු කර ඇත. පෙත්සම්කරු ඉදිරිපත්ව සිටින ලද අතර, වගඋත්තරකරුවන්ද ඉදිරිපත්ව ඇත. ඒ අනුව කොමදෝරු නිලයට උසස්වීම සඳහා සුදුසුකම් ලබන්නේ 2012.01.01 දින සිට බවට පෙත්සම්කරු විසින් සඳහන් කර ඇත. එනම් කපිතාන් නිලයේ වසර 2 1/2 ක් ගතවූ පසු ආසන්නතම ඊලඟ උසස්වීමට සුදුසුකම් ලබන බව ලේඛන අනුව තහවුරු කරන බවය. නාවික රෙගුලාසි සහ නාවික හමුදා නියෝග අනුව සෑම වසරකම ජනවාරි 01 දිනට හෝ ජූලි 01 දිනට එනම් වසරකට දෙවරක් පුරප්පාඩු එකක් හෝ පවතී නම් නාවික හමුදා උස්සවීම් සඳහා වූ මණ්ඩලය මගින් සුදුසකම් සහිත නිලධරයින් තෝරා පත්කර ගත යුතු බවද පෙන්වා දී ඇත. 2012 වසරේ සිට කොමදෝරු නිලය සඳහා පෙත්සම්කරු ඉදිරිපත් වූ පසු ලකුණු ලබාදී ඇති ආකාරය ගැටළු සහගත නොවුවද 2014 වසරේ සිට අසාධරණයක් කරන බවට පෙනී ගිය

පසු නාවික හමුදාපතිට ඒ බව ලිඛිතව සැලකර සිටිද අවධානය යොමු නොකල බව පෙත්සම්කරු දන්වා ඇත. ඒ අනුව 2014 වසරේ සිට එකී අසාධාරණය දිගින් දිගටම සිදුවීමෙන් තමාට හිමිවිය යුතු ඉහළ ජ්‍යෙෂ්ඨතාවය ලබා ගැනීමට ඉඩසලසා නොදුන් බව ප්‍රකාශ කර ඇත.

2015 වසරේ උසස්වීම් තේරීම් මණ්ඩලයේදී පෙත්සම්කාර තමා කොමදෝරු නිලයට උසස්වීමට සුදුසු බවට තීරණය කලද කොමදෝරු නිලයට උසස් නොකොට එක් තනතුරක් පුරප්පාඩුව තබා ඉතිරිව තිබූ කොමදෝරු නිලයේ පුරප්පඩු තමාට වඩා කණිෂ්ඨ නිලධාරින් මගින් පුරවා තම ජ්‍යෙෂ්ඨත්වයට හානි කල බව දක්වා ඇත. පසුව 2016 වසරේදී පෙත්සම්කරු කල විවිධ අභියාචනා ද , ඉල්ලීම්ද ජනාධිපති දක්වා කල කරුණු දැක්වීම්ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කල පෙත්සම්ද යන විවිධ කරුණු වල බලපෑමෙන් තාවකාලික කොමදෝරු නිලය අහිමි කලබව පෙන්වා දෙන ලදි. එලෙස තාවකාලිකව පත් කිරීම් පැවති උසස්වීම් රෙගුලාසි වලට අනුව පටහැනි බවද තනතුරක් පුරප්පාඩු වූ පසු එය හිස්ව තබාගෙන පැමිණි ආකාරය නාවික හමුදවේ උසස්වීම් රෙගුලාසි වලට පටහැනි බවද පෙත්සම්කරු දක්වා ඇත. එමෙන්ම අධිකරණයේ පවතින වෙනත් නැතැත්තෙකුට එරෙහිව පවරන ලද නඩුවේ තමා විත්තිකරුවකු හෝ සාක්ෂිකරුවකු ලෙසවත් නම්කර නොතිබියදී එකී නඩුව හේතුකොටගෙන බව පවසා තම උසස්වීම ස්ථිරව හිමිකර නොදී විවිධ රාජ්‍ය ආයතන එනම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යංශය, ආරක්ෂක අමාත්‍යංශය ආදී ආයතන වෙතින් උසස්වීම තමාට දිය හැකිද යන්න විමසමින් වසර ගණනාවක් කාලය ගත කල බවද පෙන්වා දී ඇත. එහෙත් අධිකරණයේ නඩු කටයුතු පවතින වෙනත් නිලධාරින්ට උසස්වීම් ලබාදී තමාට පමණක් වෙසන් ආකාරයකට සැලීකීමට ලක් කල බවද මෙදින පරීක්ෂණ අවස්ථාවේ පෙත්සම්කරු පෙන්වා දී ඇත. වගඋත්තරකරුවන්ට කල අභියාචනා නොසලකා හරින ලද බවද තමාට වඩා කණිෂ්ඨ නිලධාරින් ද තමා යටතේ පුහුණුවීම් ලබාගත් නිලධාරින් ද තමාට වඩා ජ්‍යෙෂ්ඨත්වයකට පත්කර ස්ථිරකර උස්සවීම් ලබාදීමෙන් පෙත්සම්කාර තමා ගැටළු සහගත තත්වයකට හා බරපතල අසාධරණයකට ලක් කලබවද පෙන්වා දී ඇත. මහාධිකරණයේ නඩු කටයුතු පවතින අතර, නිලයේ ස්ථිර කර උසස්වීම් ලද නිලධාරින් රැසකගේ නම් සහ තනතුරු නාම පරීක්ෂණ දින පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර ඇත. මෙදින වගඋත්තරුවන් සතුව ඉහත කරුණු වලට අදාලව ලේඛන නොමැති බැවින් එකී ලේඛනද සමග නැවත ඉදිරිපත් වීමට දක්වා ඇත..

2018.11.30 දිනද වැඩිදුර වාර්තාවක් වගඋත්තරකරුවන් වෙතින් කැඳවන ලද්දේ එතෙක් හෙළි වූ කරුණු තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ලේඛන පරීක්ෂා කිරීමටය. 2019.04.10 දිනද පෙත්සම්කරු කොමිෂන් සභාව අමතා ලිපියක් ඉදිරිපත් කරමින් තම නිලයේ උසස්වීම ස්ථිර නොකිරීමෙන් දීර්ඝකාලීනව සිදුවන අගතිය කඩිනමින් වලක්වා දෙන ලෙස ඉල්ලීමක් කර

ඇති බව සනාථ වේ. 2020.08.26 දින නාවික හමුදාපති විසින් සකස් කළ වාර්තාව ආරක්ෂක අමාත්‍යාංශය මගින් කොමිෂන් සභාව වෙත ලබාදී තිබිණි. මෙම වාර්තාවේ පිටපතක් පෙත්සම්කරුට ලබාදී එයට අනුව අවසන් කරුණු දැක්වීමට තිබේනම් ඊට පිළිතුරුද ලබාදෙමින් අවසන් පරීක්ෂණයේ දී ඉදිරිපත් වීමට දන්වා ඇත. ඒ අනුව 2020.09.15 දින අවසන් පරීක්ෂණයට පාර්ශවයන් කැඳවා ඇත. මෙහිදී වගඋත්තරකරුගේ ඉහත කී අවසන් වාර්තාවේ ඇති කරුණු වලට අදාළව පෙත්සම්කරුගේ පිළිගැනීම් හා විරෝධතා සටහන් කරමින් පරීක්ෂණය අවසන් කිරීමට දෙපාර්ශවය එකග වී ඇත. මෙහිදී එකී වාර්තාවේ ප්‍රශ්නගත කරුණු සඳහා පිළිතුරු වාර්තා කිරීම් සිදු කිරීමට තීරණය කර ඇති අතර, එහිදී පෙත්සම්කරු යුධසමයේ දක්වන ලද ක්‍රියාන්විත දායකත්වය ඇගයීමකට ලක්කර ලබාදුන් ක්ෂේත්‍ර උසස්වීම නිර්දේශ කර තිබියදී එවැනි නිර්දේශයක් නාවික හමුදාවේ නොමැති බවට දක්වා ඇත්තේ කුමන හේතුවක් මත විමසා ඇත. වගඋත්තරකරු දන්වා ඇත්තේ, මෙම ලේඛනය අද දින ප්‍රථම වතාවට දුටු බවද මෙම පෙත්සම්කරුගේ පුද්ගලික ලිපි ගොනුවේ හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරින් උසස් කිරීමට අදාළ ලිපිගොනුවල එවැනි ශීර්ෂයක් සහිත ලේඛනයක් නොමැති බවය. එහෙත් මෙම ලේඛනයේ පිටපත් පෙත්සම්කරු විසින් පරීක්ෂණ අවස්ථාවේ ඉදිරිපත් කරමින් නාවික හමුදාව විසින් එම ලේඛන නොමැති බවට ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කර සිටි. මෙය හිතාමතාම අස්ථානගත කළ බවද 2009 වසරේදී රටතුල ත්‍රස්තවාදී ක්‍රියා අවසන් වූ පසු නිකුත් කළ වැදගත්ම ලේඛනයක් බවද මෙය ත්‍රිවිධ හමුදා විසින්ම ඒ ඒ හමුදාවන්හි උසස්වීම් සඳහා නිර්දේශ කර තිබූ ලේඛනයක් බවද ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේ හිමි විය යුතු උසස්වීම ප්‍රදානය කරන ලද්දේ නම් වර්තමානය වන විට තමා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨතම නිලධාරියා වන නාවික හමුදාපති දක්වා ලැයිස්තුගත වන බවද එය අහිමිකිරීමෙන් තම සියළුම උසස්වීම් අහිමි වූයේ වෙනස්කොට හාජනය වෙමින් බව ප්‍රකාශ කර ඇත.

නාවික හමුදාපති විසින් කොමිෂන් සභාවට ලබා දී ඇති අවසන් වාර්තාව ප්‍රකාරව දන්වා ඇත්තේ පෙත්සම්කරුට හිමි රණවික්‍රම පදක්කම උසස්වීම හිමිවිය යුතු දිනට පසුව කළ ප්‍රදානයක් බවය. එය නාවික හමුදාපති විසින් කළ සාවද්‍ය ප්‍රකාශයක් බව පෙත්සම්කරු කියා සිටින අතර, වෙනත් පදක්කම්ලාභී තැනැත්තන් හට එයට හිමි ලකුණු ලබාදී තමාට එකී ලකුණු අහිමිකර තිබීමෙන් 2013 ජනවාරි මස හිමි විය යුතු උසස් වීම් අහිමි කළ බව ප්‍රකාශ කර සිටි. නාවික හමුදාපති වෙනුවෙන් වගඋත්තරකරු ප්‍රකාශ කර ඇත්තේ, එවන ලද වාර්තාවේ කරුණු වලට පරිබාහිරව යමක් ප්‍රකාශ නොකරන බවය.

තවද පූරප්පාඩු පැවතියදී වසරකට දෙවරක් තේරීම් මණ්ඩල රැස්විය යුතු බවද 2013 ජූලි මස 01 දිනට එය රැස්ව නොතිබීමෙන් ද තමාට උසස්වීම අහිමි වීමට හේතු යෙදී තිබුණු ආකාරය සහ ඒ අනුව ජ්‍යෙෂ්ඨතාවයෙන් වඩාත් පහළට තමා පත්වූ බවද පෙන්වා දී ඇත. වගඋත්තරකරු මේ සම්බන්ධව වැඩිදුර යමක් ප්‍රකාශ කර නොමැත. ආරක්ෂක අමාත්‍යාංශය

වෙනුවෙන් ද කරුණු වාර්තා කරමින් දන්වා ඇත්තේ යම් ලේඛනයක් සුරක්ෂිතව තබා ගනිමින් අදාල ගොනු පවත්වාගෙන යාම ත්‍රිවිධ හමුදාව සතු වගකීමක් බවද යම් ලේඛනයක් හෝ ගොනු අස්ථාන ගතව තිබේ නම් ඒ පිළිබඳ විශේෂ කමිටුවක් පත්කොට සොයා බැලීම නාවික හමුදාපති සතු වගකිවයුතු කාරණවක් බවය. ඒ අනුව දීර්ඝ වශයෙන් කරුණු සාකච්ඡා කර වර්තා කරමින් එදින පරීක්ෂණයෙන් පසු පෙත්සමට අදාල පරීක්ෂණ කටයුතු අවසන් කර ඇත.

**නිරීක්ෂණ හා නිගමන :-**

මෙම පෙත්සමට අදාල සියළුම කරුණු ඉදිරිපත් කිරීමද වගඋත්තරකාර පාර්ශවයේ සියළු ලිඛිත දේශන වාර්තා සහ පරීක්ෂණ දිනයන්හිදි ඉදිරිපත් කළ කරුණුද අනුව නිරීක්ෂණය වන කරුණු පහත පරිදි වේ.

පෙත්සම්කරු පෙත්සම ගොනු කරන දින වන විට වසර 30 කට ආසන්න කාලයක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවය කර ඇති අයෙකු බව පැහැදිලි වේ. 1987.06.15 වන දින සේවයට බැදෙන ඔහු නාවික හමුදාවේ විවිධ අංශ සහ ක්ෂේත්‍රයන්හි ද නාවික යාත්‍රා සහ නෞකාවන්හිද අණදෙන නිලධාරි සහ අධ්‍යක්ෂ ධූරවලින්ද යුතුව දීර්ඝ කාලයක් සේවය කර ඇති බව නිරීක්ෂණය වේ. විදේශ පාඨමාලා රැසක් අවසන් කර දැනට වයඹ පළාත් භාර අණ්ඩාපතිවරයා ලෙස රාජකාරි කටයුතු සිදු කරමින් සිටින බවද අනාවරණය වේ.

මෙම පෙත්සම ගොනු කරමින් පෙත්සම්කරු කියා සිටින කරුණු අනුව විසඳිය යුතු වඩාත් වැදගත් කරුණු කිහිපයක් වෙත අවධානය යොමු කරන ලදී. එනම්,

01. පෙත්සම්කරුට නිර්දේශිත ක්ෂේත්‍ර උසස්වීම නිසි අවස්ථාවේ හිමිකර දීමට කටයුතු කර නොතිබේද ?

02. රණවික්‍රම පදක්කම සදහා පෙත්සම්කරුට අදාල ලකුණු ලබාදෙන අවස්ථාවල පෙත්සම්කරුට එක් ආකාරයකටත් වෙනත් නිලධාරීන්ට තවත් ආකාරයටත් ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් වන පරිදි කටයුතු සිදුකර තිබේද?

03. ජ්‍යෙෂ්ඨතා ලේඛණ සකස් කිරීමේදි ලකුණු ලබාදෙන අවස්ථාවල පෙත්සම්කරුට එක් ආකාරයකටත් වෙනත් නිලධාරීන්ට සහන සහ සහාය ලැබෙන ආකාරයට හිතාමතාම ජ්‍යෙෂ්ඨත්වයට බලපෑමක් වන පරිදි ක්‍රියාවක් සිදුකර තිබේද?

04. පෙත්සම්කරුට උසස්වීම සඳහා හිමිකමක් ලැබිය යුතු දිනට ඔහුට එරෙහිව යම් අධිකරණයක නඩු කටයුත්තක් විභාග වෙමින් තිබූ බව සත්‍ය වේද?

05. පෙත්සම්කරු තමාට සිදුවන අසාධාරණමය කටයුතු පිළිබඳ දක්වා වගඋත්තරකරුවන්ට ඉදිරිපත් කල අභියාචනා සලකා බලා තිබේද?

06. නාවික හමුදාපති වෙනුවෙන් ලබාදී ඇති වාර්තා සහ කරුණුද පෙත්සම්කරු ලබාදෙන ලද කරුණුද අතර පරස්පරභාවයක් තිබේද?

07. පෙත්සම්කරුට හිමිවිය යුතු ජ්‍යෙෂ්ඨත්වය අහිමි කිරීමක් සිදුව තිබේ නම් හිතාමතා හෝ ද්වේශ සහගතව හෝ නොසලකා හරිමින් කටයුතු කර තිබීමක් ඉන් තහවුරු වේ නම් ඉන් මූලික අයිතිවාසිකම් කඩවීමේ තත්වයක් අනාවරණය වන්නේද?

01. ක්ෂේත්‍ර උසස්වීමට අදාලව අනාවරණය වී ඇති කරුණු පහත පරිදි වේ.

නාවික හමුදාපති වෙනුවට පැමිණි වගඋත්තරකරුවන් දක්වා ඇත්තේ, මෙවැනි ක්ෂේත්‍ර උසස්වීමක් සම්බන්ධව මෙම පෙත්සම්කාර නිලධාරිවරයාගේ පුද්ගලික ලිපි ගොනුවේ හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උසස් කිරීම් සඳහා පවත්වාගෙන යනු ලබන ලිපි ගොනුවේ හෝ වෙනත් කිසිදු ගොනුවක ක්ෂේත්‍ර උසස්වීමක් පිළිබඳව ලේඛනයක් නොමැති බවය.

පෙත්සම්කරු එය අසත්‍යයක් බවට කරන කරුණු දක්වමින් 2020.09.15 දින අවසන් පරීක්ෂණ අවස්ථාවේ පී-01 ලෙස ගොනුගත කල ලේඛනයට අවධානය යොමු කිරීමේදී, එහි දක්වා ඇත්තේ 2009.09.17 දිනැතිව නාවික හමුදාපති වෙත හිටපු නාවික හමුදාපති වන ඩබ්.කේ.ජේ.කරන්නාගොඩ මහතා විසින් ඉදිරිපත් කල රහස්‍ය ලේඛනයකි. ආරක්ෂක අමාත්‍යංශ ලේකම් වෙතින් ලද උපදෙස් මත සකස් කල ක්ෂේත්‍ර උසස්වීම් සඳහා නිර්දේශිත නාමාවලියක් බව දක්වන එකී ලිපියෙන් වැඩිදුරටත් දක්වා ඇත්තේ, විවිධ ආඥාපතිවරුන්ද ඒ ඒ පළාත් භාර නාවික හමුදා ප්‍රධානීන්ද ඇතුළු තවත් ක්ෂේත්‍ර ප්‍රධානීන් සමග සාකච්ඡා කර සකස් කල එකක් බවය. පිටු දහසයකින් යුතු එම ලේඛනයේ නිර්දේශයන්, නිර්නායකයන් සහ තීරණයන් දක්වා ඇති අතර, රහස්‍ය ලේඛනයක් බවට මුද්‍රා තබා ඇත. හිටපු නාවික හමුදාපති මගින් එහි පිටපතක් ලබා කොමිෂන් සභාවේ පරීක්ෂණයට ඉදිරිපත් කිරීමට පෙත්සම්කරුට හැකියාව තිබියදී නාවික හමුදාපති විසින් එය තම ගොනු වල නොමැති බව ප්‍රකාශ කිරීම බරපතල කාරණාවකි. ආරක්ෂක අමාත්‍යංශයේ ප්‍රකාශය වන්නේ එවැනි රහස්‍ය ලේඛනයක් නාවික හමුදාපතිගේ ගොනුවල නොමැති නම්, අස්ථානගතව තිබේ නම් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පැවැත්විය යුතු බවය. එමෙන්ම ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් සතු එක් වගකීමක් වන්නේ නිලධාරීන්ගේ පුද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම කලින් කලට දක්ෂතා අනුව නිලධාරීන්ගේ එකී කරුණු යාවත්කාලීන කිරීම, සුරක්ෂිතව පවත්වාගෙන යාම සඳහා

සංස්ථාපිත පරිපාලන ඒකකයක් තබා ගැනීම ආදිය බවය. පෙත්සම්කරු ප්‍රකාශ කර ඇත්තේ. තමා හොඳින්ම දන්නා කාරණාවක් වන්නේ නාවික හමුදාවේ ගොනු තුළ මෙම ලේඛන තිබූ බවය. පී-2 ලෙස අවසන් පරීක්ෂණ දින පෙත්සම්කරු ගොනු කරන ලේඛන අනුවද එය තහවුරු වේ.

එවකට පැවති ත්‍රස්තවාදි කටයුතු අවසන් වූ පසු ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් හට උසස්වීම් ප්‍රදානය කිරීමට ආරක්ෂක ලේකම් ලෙස සිටි වර්තමාන ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිතුමා විසින් ත්‍රිවිධ හමුදා ප්‍රධානීන් වෙත කල දැන්වීමට අනුව මෙය සකසා ඇති බවද ලේඛන පරීක්ෂා කිරීමේදි සනාථ වේ. මෙවැනි උසස්වීමක් ලබාදීම සඳහා නිලධාරීන්ට ඇති නීතිමය තත්වයන් මොනවාද යන්න වෙත අවධානය යොමු කරන ලදි. එහිදී නිරීක්ෂණය වන්නේ නාවික හමුදාවේ උසස්වීම සඳහා බලපාන්නේ උපදෙස්, නියෝග හා රෙගුලාසි බවය. මෙහිදී 1950 නාවික හමුදා රෙගුලාසි වලට නීති තත්වයන් වැදගත් වේ. 1950 නාවික හුමදා රෙගුලාසි වලට අනුව එහි ජේද 10 සහ 11 වැදගත් බව පෙත්සම්කරු තම පී-3 දරණ ලේඛනය තුලින් තහවුරු කර දී ඇත. එහි ඇත්තේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ උසස්වීම් පිළිබඳවය. කඩිනම් උසස්වීම් පිළිබඳව ජේද අංක 11 තුල දක්වා ඇත. නාවික හමුදාවේ උන්නතිය සඳහා කඩිනම් උසස්වීම් ලබාදීමට එහි නියෝග කර ඇත. ඊට අදාල වන ජනාධිපති විධානයක් 1992 දී තිබී ඇත. දක්ෂතා දක්වන නිලධාරීන් හට පවතින පුරප්පාඩු වලින් 80% ද ජ්‍යෙෂ්ඨතාවය මතද උසස්වීම් ඉන් 20% ක්ද ලබාදීමට නියෝග කර ඇති බව අවසන් පරීක්ෂණයේ අමුණා ඇති පී-04 ලේඛන අනුව තහවුරු වේ.

මෙය වරින්වර සංශෝධනය වෙමින් 2004 හා 2014 වසරේද 2019 වර්ෂයේද උසස් කිරීම් ක්‍රමවේදයක් සකසා ඇති බව පෙනී යයි. පී -06 සහ පී-07 දරණ අවසන් පරීක්ෂණ දින අමුණා ඇති ලේඛන අනුව එය තහවුරු වේ. ඒ අනුව දක්ෂතා මත හිමිවිය යුතු උසස්වීම සඳහා 2009 වසරේදි හිටපු නාවික හමුදාපති විසින් නිර්දේශ කරන ලද නාමාවලියේ තම නමද නිර්දේශ වී තිබියදී එය නිසි දිනට ලබා නොදි ලේඛන නොමැති බවට වර්තමාන නාවික හමුදාපති විසින් ප්‍රකාශ කිරීම හා එකී ලේඛන කොමිෂන් සභාවේ පරීක්ෂණයේදී හිටපු නාවික හමුදාපතිගේ ගොනුවේ පිටපත් මගින් පෙත්සම්කරු ඉදිරිපත් කිරීමද ගැටළු සහගත වේ. මේ දක්වා එකී ලේඛන පිළිබඳව කොමිෂන් සභාවද ලිඛිත පරීක්ෂණ අවසන් වනතුරු විමසා ඇතත්, ගොනු තුළ ඇති එවැනි ලේඛනයක් අස්ථානගත වී තිබේ නම් ඊට අදාලව නාවික හුමාදපති විසින් කරුණු සොයා බලා නොමැති බව නිරීක්ෂණය වේ. මෙවැනි බරපතල සිදුවීමක් එනම්. නාවික හමුදාවේ රහස්‍ය ලේඛනයක් අතුරුදහන්ව තිබියදී එය නොදන්නා බවට ප්‍රකාශ කිරීමට වඩා ආරක්ෂක අමාත්‍යාංශය පරීක්ෂණ දින ප්‍රකාශ කල පරිදි අභ්‍යන්තර විනය කමිටුවක් පත්කර සොයා බැලීම වඩාත් සුදුසු පියවර වුවද එවැනි කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව ලේඛන අනුවද වාර්තා වී ඇති කරුණු අනුවද පෙත්සම්කරුට 2009 වසරේදි නිර්දේශිත ක්ෂේත්‍ර උසස්වීම ලබා ගැනීම සඳහා

ඇති අවස්ථාව අහිමිව ඇත්තේ පසුකාලීනව නාවික හමුදාපතිවරුන් නොසලකා හරිමින් කටයුතු කර තිබීම මත බව පෙනී යයි. එය හිතාමාතාම අස්ථානගත කර තිබේනම් ද්වේශ සහගත ක්‍රියාවක ප්‍රතිඵලයක් ද විය හැක. මේ පිළිබඳව පෙත්සම්කරු කරුණු දැක්වීමට ඉල්ලා සිදුකල අභියාචනයද වගඋත්තරකරුවන් නොසලකා හැර ඇති බව පෙනී යන්නේ වගඋත්තරකරුවන් එකී අභියාචනා සලකා බලා ගත් පියවරක් වාර්තා නොවන බැවිනි. ඉතාමත් තීරණාත්මක උසස්වීමක් අහිමි කර හෝ එය ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමි කර තිබීමෙන් 2009 වසරේ දී පෙත්සම්කරු පත්ව තිබිය යුතු උසස්වීම අහිමිවීම හිමිවිය යුතු උසස්වීම් වලදී ද ඔහුට බලපෑමක් වීමෙන් අප්‍රතිකාරී නොසලකා හැරීමකට ලක්ව ඇති අතර, ඉන් පෙත්සම්කරු 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12, 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමකට ලක්ව ඇති බව තහවුරු වේ.

02. පෙත්සම්කරුට හිමි රණවිරු පදක්කමට අදාලව ලකුණු ලබා නොදී තිබීම සම්බන්ධව නාවික හමුදාපති දක්වා ඇති කරුණු වලට පෙත්සම්කරු දැඩි විරෝධතාවයක් දක්වා එය හිතාමාතාම ද්වේශ සහගතව සිදු කල බව ප්‍රකාශ කරමින් එය කොමිෂන් සභාව වෙත නාවික හමුදාපති සිදුකල අසත්‍ය ප්‍රකාශයක් බවට කරුණු දක්වා තිබීම වෙත අවධානය යොමු කරන ලදී.

විශ්‍රාමික රියර් අද්මිරාල් ඩී.එන්.සී.එස්. කළුබෝවිල යන අය හට හිමිව තිබූ වීර ක්‍රියා පදක්කමට ලකුණු 02ක් ලබා දී තම රණවික්‍රම පදක්කමට හිමි වියයුතු ලකුණු 03 අහිමි කිරීමෙන් 2013 ජනවාරි මස හිමිවිය යුතු උසස්වීම අහිමි කල බවට පෙත්සම්කරු කරුණු දක්වා ඇත. මෙහිදී වගඋත්තරකාර ආරක්ෂක අමාත්‍යාංශය පසුව පිළිතුරු දෙන බවත් නාවික හමුදාපති එවා ඇති වාර්තාව පමණක් නාවික හමුදාපති වෙනුවට පැමිණි වගඋත්තරකරු පිළිගන්නා බවටත් ප්‍රකාශ කර ඇත. ඒ අනුව නාවික හමුදාපතිගේ වාර්තාවේ ඇත්තේ 2013 වසරේ ජනවාරි 22 දින පැවැත්වූ උසස්වීම් මණ්ඩලය මුල් අවස්ථාවේදී එකී පදක්කමට හිමි ලකුණු 03 ලබාදී ඇතත්. පසුව අහිමි කර ඇත්තේ ඒවන විට එම පදක්කම පෙත්සම්කාර නිලධාරී වෙත ප්‍රදානය කර නොමැති බැවින් බවය. 2013 අගෝස්තු 01 වන දින මෙම පදක්කම ප්‍රදානය කර ඇත්තේ. 2013 ජනවාරි මසට මාස 07කට පසු බව නාවික හමුදාපතිගේ ප්‍රකාශය වේ. ඒ අනුව පදක්කම්ලාභී විශ්‍රාමික රියර් අද්මිරාල් ඩී.එන්.එස්. කළුබෝවිල මහතා සහ කා/රියර් අද්මිරාල් පී.ඩී.එස්.ඩයස් යන අයටද ලකුණු ලබා නොදුන් බව අදාල ලේඛන 01 සහ 02 ලෙස අමුණා ඉදිරිපත් කරමින් කරුණු දක්වා ඇත. 2013.12.05 සහ 2015.01.20 දිනැති උසස් කිරීම් මණ්ඩල වලදී ඊට අදාළ ලකුණු හිමිකර දී ඇති බවද ලේඛන ඇමුණුම් 03 සහ 04 මගින් දක්වා ඇත. ඒ අනුව පෙත්සම්කරුගේ විරෝධතාවය වෙත අවධානය යොමු කර ඇති අතර. එහිදී පෙන්වා දී ඇත්තේ. 2013 ජනවාරි මසට කොමදෝරු නිලයේ පුරප්පාඩු 03ක් තිබූ බවත්, නාවික හමුදා නීති ප්‍රකාරව උසස්වීම් ලබාදීමට තේරීම් මණ්ඩලයක් පත්කල බවත්, පළමුව 2012 දෙසැම්බර් මස සිට එකී මණ්ඩලය තෝරා සුදුස්සන්

03 කු නම් කළ බවද වේ. එම ලැයිස්තුවේ පෙත්සම්කරුගේ නම 07 වන ස්ථානයට ඇතුලත් කර ඇති බවද නිරීක්ෂණය වේ. එහිදී ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළ නිලධරින් සිටියදී කනිෂ්ඨ නිලධාරින් තෝරා තිබීම මත නැවත තේරීම් මණ්ඩලයක් විසින් තෝරාගැනීමක් සිදුකර එකී නිර්දේශය 2013 ජනවාරි 22 දින ඉදිරිපත් කරමින් අංක 01 ට කපිතාන් ඩී.එම්.එස්.සී. කලුබෝවිල නම් කර ඇත්තේ ඔහුට හිමි රණශූර පදක්කමට අදාල ලකුණු 02 ද ලබා දීමෙන් බව තම නම පී-09 සහ පී-10 යන ලේඛන මගින් පෙන්වා දී ඇත.

තවද පුරප්පාඩු 03ක් සඳහා උසස්වීම් සලකා බැලූවද 04 දෙනෙකු දක්වා උසස්වීම් ලබාදී ඇති බවද පෙත්සම්කරුගේ පදක්කමට හිමි ලකුණු 03 අහිමි කිරීමෙන් ජ්‍යෙෂ්ඨත්වය පහළ හෙලා ඇති බවද නිරීක්ෂණය වේ. පෙත්සම්කරුට හිමි පදක්කමට හිමි ලකුණු 03 ගණනත් බලන ලද්දේ නම් 04වන ස්ථානයට පෙත්සම්කරු තේරිපත්විය යුතුය. නාවික හමුදාවේ ඇති උසස්වීම් සම්බන්ධව පවතින කටයුතු වලට අදාල විශ්වාසනීයභාවය බිඳවැටෙන පරිදි මෙයින් කටයුතු සිදුව ඇති අතර, මෙයින් පෙත්සම්කරුගේ ජ්‍යෙෂ්ඨත්වය අහිමි කර එය පහත හෙළීමට යම් ක්‍රියාවක් සිදුව ඇති බව පැහැදිලි වේ. ඒ අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 12(1) ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමකට පෙත්සම්කරු ලක්ව ඇති බව තහවුරු වේ.

03. ජ්‍යෙෂ්ඨතා ලේඛන සකස් කිරීමේදී පෙත්සම්කරුට එක් ආකාරයකට සහ වෙනත් නිලධාරින්ට තවත් ආකාරයකටත් කටයුතු කරමින් ක්‍රියා කර තිබේද යන්න වෙතද අවධානය යොමු කරන ලදී.

මෙහිදී පදක්කම් සඳහා ලකුණු ලබාදී උසස්වීම් ලබාදීමේදී ක්‍රියා පළිවෙත ලෙස ඇත්තේ වීරක්‍රියා සඳහා පදක්කම් ලද නිලධාරින් හට ඊලග නිලය සඳහා උසස්වීම් ලබාදීමේදී පමණක් එය සලකා බලන බවය. එය පසුව වෙනත් නිලයක් සඳහා උසස්වීම් ලබාදීමේදී සලකා බැලිය නොහැකි බවය. පෙත්සම්කරුගේ අවසන් පරීක්ෂණ දිනට අදාළව ඉදිරිපත් කල පී-11 දරණ ලේඛන අනුව එය දක්වා ඇතත්. පෙර කී උසස්වීම් ලද නිලධාරින් හට ඊට පටහැනිව වෙනත් නිලයන් සඳහාද ලකුණු ලබාදී ඇති බව පෙත්සම්කරු දන්වා තිබීම ද නිරීක්ෂණය වන කාරණාවකි.

තවද පුරප්පාඩු පවතී නම් තේරීම් මණ්ඩලය රැස්විය යුතුය. පුරප්පාඩු 02 ක් පැවතියද 2013 ජූලි 01 වන දිනට අදාල උසස්වීම් මණ්ඩල රැස්ව නැති බව පෙනී යයි. එසේ කටයුතු නොකිරීමට පියවර ගන්නේ නම් මාණ්ඩලික වාර්තාවක් හෝ ගොනු කලයුතු වුවද එවැනි වාර්තාවක් ගොනු ගත කර නැති බව පෙනී යයි. එබැවින් පෙත්සම්කරුට එම අවස්ථාවේ උසස්වීමට සුදුසුකම් තිබුනද එකී අවස්ථාවද මින් අහිමිවී යන බව පෙනී යයි. 2013.01.01 දින උස්සවීම් ලද නිලධාරින් හතරදෙනා මාස 06 ක් තුළ ස්ථිර කර ඇති අතර, තාවකාලික

නිලයක සිටින අයෙකු ස්ථිර කල යුත්තේ වසර 01ට පසු යන්න පවතින ක්‍රමවේදය වුවද මාස 06ක් තුල ස්ථිර කිරීමෙන් එකී නිලධාරීන් ජ්‍යෙෂ්ඨතාවයෙන් ඉහලට යාමට තවත් අවස්ථාවක් ඉන් ඇති කල බව පෙනී යන කාරණාවකි. එමෙන්ම නියමිත දිනට උසස්වීම් මණ්ඩල නොතැබීමෙන් පෙත්සම්කරු තවත් කාලයක් ගතවනතුරු උස්වීම් අහිමි කර ජ්‍යෙෂ්ඨතාවය පහත හෙළීමේ උපක්‍රමශීලි ක්‍රියාපිළිවෙතක් ලෙස මෙසේ සිදු කල බවටද පෙත්සම්කරු සැකකර තිබීම සාධාරණ විය හැකි බව පෙනී යයි.

තවද උසස් කිරීම් මණ්ඩලය විසින් ලකුණු ලබාදීමේදී විෂමතාවයක් ඇති කර තිබෙන බවද "සාර්ථකත්වයන් සහ ඊලග නිලයට උසස් කිරීම සඳහා සුදුසු නුසුදුසුභාවයට" අදාලව ලකුණු ලබාදීමේදී පෙත්සම්කරුට අඩු ලකුණු ප්‍රමාණයක් ලබාදීම මත ආරක්ෂක අමාත්‍යංශය විසින් නාවික හමුදාවෙන් කරුණු විමසා ඇති බවද, නිරීක්ෂණය වේ. 2013.12.05 දින උසස්වීම් මණ්ඩල වාර්තා වලට අනුව මණ්ඩලයට ලබාදිය හැකි ලකුණු 20 අවභාවිතා කරමින් පෙත්සම්කරුට ලකුණු 02ක් බැගින් 04ක් සහ තේරී පත්ව ඇති අනෙකුත් නිලධාරීන්ට ලකුණු 16 ක් බැගින් ලබාදී ඇති බවද ලකුණු 12 ක පරතරයක් ඇති කර තිබෙන බවද පරීක්ෂණ අවස්ථාවේදී පෙත්සම්කරු දක්වා ඇත. එය නාවික හමුදාවේ ප්‍රථම වරට සිදුව ඇති බව පෙත්සම්කරුගේ අදහස වේ. මේ පිළිබඳව දීර්ඝව කරුණු දක්වා පෙත්සම්කරු අභියාචනාවක් නාවික හමුදාපති වෙත ඉදිරිපත් කලද නොසලකා හැර ඇති බව පෙනී යන්නේ එයට අනුව ගත් පියවරක් වාර්තා නොවන බැවිනි. ඒ අනුව එයින්ද 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 වන ව්‍යවස්ථාව සහ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වීමට පෙත්සම්කරු ලක්ව ඇති බව තහවුරු වන බව නිගනමනය කරමි.

04. පෙත්සම්කරුට එරෙහිව යම් අධිකරණයක නඩු කටයුත්තක් තිබීම උසස්වීම ලබා ගැනීමට එරෙහිව ඇතිව තිබේද යන්න නිරීක්ෂණය කරන ලදී.

2009 වසරේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලුතිනන් කොමාන්ඩර් තිලන්ත සම්පත් මුණසිංහ යන අයට එරෙහිව ඔහු සැකකරුවකු බවට පත්කරමින් පවරා ඇති නඩුවේදී හෝ වෙනත් කිසිම නඩු කටයුත්තක පෙත්සම්කරු විත්තිකරුවකු හෝ සැකකරුවකු හෝ සාක්ෂිකරුවකු හෝ නොවන බව නිරීක්ෂණය වේ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ තම පෙත්සම ගොනු කරමින් පෙත්සම්කරු තමාට 2009 වසරේ සිට හිමිවිය යුතු උසස්වීම් සම්බන්ධව දිගින් දිගටම කරනු ලබන යුක්ති සහගත නොවන වෙනස් කොට සැලකීම පිළිබඳව දක්වා ඉන් තමාට ඇතිව තිබෙන මානසික හිංසනයද පීඩනයද පිළිබඳ දක්වා ඇත.

ඒ අනුව 2009 වසරේ සිට 2015.07.02 දින පෙත්සම ගොනු කල දින දක්වා කාලය තුළ පෙත්සම්කරුට අදාල උසස්වීම් ලබාදීමේදී කරන ලද අගතියක් හෝ නොසලකා හැරීමක් හෝ

වෙනස් කොට සැලකීමේ ආකාරයක් සිදුවන්නේද යන්න හා ඒ අනුව පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් තහවුරු වේද යන්න සලකා බැලීම සුදුසු බව නිරීක්ෂණය විය. ඒ අනුව එකී කාලය තුළ කිසිදු අධිකරණයක පෙත්සම්කරුට එරෙහිව නඩු කටයුත්තක් නොතිබුණද තවත් නිලධාරීන් ගණනාවක් හට මහාධිකරණයන්හි නඩු පවරා තිබියදී උසස්වීම් ලබා දී ඇති බව ගොනුවේ කරුණු පරීක්ෂා කිරීමේදී සනාථ වේ. ඒ අනුව පෙත්සම්කරුට එක් ආකාරයකටත් වෙනත් නාවික හමුදා නිලධාරීන් හට තවත් ආකාරයකටත් නාවික හමුදා රෙගුලාසි සහ නියෝග ක්‍රියාත්මක කිරීමේදී කටයුතු කර තිබීමෙන් හා ඊට අදාලව කල අභියාචනා සහ ඉල්ලීම් නොසලකා හැර තිබීමෙනුත් වගඋත්තරකරුවන් විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ 12 ව්‍යවස්ථාව සහ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝණය කරමින් කටයුතු කර ඇති බව නිගමනය කරමි.

**05. පෙත්සම්කරු විසින් තමාට සිදු වූ අසාධාරණ ක්‍රියා කලාපයන් හා ඊට එරෙහිව කරන ලද අභියාචනා වගඋත්තරකරුවන් විසින් සලකා බලා අවශ්‍ය පියවර ගෙන තිබේද යන්න නිරීක්ෂණය කරන ලදී.**

මෙහිදී 2020.08.26 දිනැති ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් කොමිෂන් සභාව වෙත ලබා දී ඇති නාවික හමුදාපතිගේ වාර්තාවට අනුව 1-ඇ හි දෙවන ඡේදයෙන් දක්වා ඇත්තේ 2014.01.01 දිනැති පෙත්සම්කරුගේ අභියාචනා පෞද්ගලික ලිපිගොනුවේ ඇතත්, ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ගයක් පිළිබඳ කරුණු අඩංගු නොවන බවය. එමෙන්ම ලේකම් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පෙත්සම්කරුගේ අභියාචනා සම්බන්ධව ගන්නා ලද අවසන් පියවරක් පිළිබඳව වාර්තා නොවේ. මෙම නොසලකා හැර තිබීමේ කටයුත්තක් වගඋත්තරකරුවන් විසින් සිදුකර තිබීමෙන්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කළ 12 ව්‍යවස්ථාව උල්ලංඝනය වන බව නිගමනය කරනු ලැබේ.

**06. පෙත්සම්කරු සහ වගඋත්තරකරුවන් ඉදිරිපත් කරනු ලබන තොරතුරු අතරද යම් වෙනසක් පෙන්නුම් කර තිබේ.**

පෙත්සම්කරු විසින් තම කරුණු තහවුරු කරමින් අවසන් පරීක්ෂණ අවස්ථාවේ සියලු කරුණු තම ලේඛනමය සාක්ෂි මගින් ඉදිරිපත් කරමින් තහවුරු කර ඇත. නාවික හමුදාව විසින් ඉදිරිපත් කර ඇති වාර්තා අනුව යම් යම් ලේඛන අදාළ ගොනු තුළ නොමැති බවට දක්වා ඇති නමුත් ඉතා වැදගත් රහස්‍ය ලේඛන අතුරුදහන්ව තිබීම හෝ නොමැති බව සම්බන්ධව නාවික හමුදාව වශයෙන් ගත් පියවරක් හෝ අනාවරණය නොවන අතර එය නාවික හමුදාව සතු වගකීම බරපතල ලෙස පැහැර හැර තිබීමක් බව පෙන්වා දිය යුතුය. නාවික හමුදාව සතු විශ්වාසනීයත්වය බිඳ වැටෙන ලෙස කටයුතු කර ඇති අතර, එකී කටයුත්ත පමණක් නොව පෙත්සම්කරුගේ අභියාචනා වසර දහයකට ආසන්න කාලයක්

නොසලකා හැර ඇති බවද පෙනී යන්නේය. පදක්කම් සඳහා ලකුණු ලබා නොදුන් බව නාවික හමුදාව විසින් කියා සිටිමින් ලේඛන ඉදිරිපත් කළද පෙත්සම්කරු වෙනත් ලේඛන ඉදිරිපත් කරමින් එකී කරුණු බිඳහෙලීමට පියවර ගන්නා ලද බවද පෙන්වා දිය යුතුය. ඒ අනුව නාවික හමුදාව විසින් උසස්වීම් ලබා දීමේදී පෙත්සම්කරුට එරෙහිව ද්වේශ සහගතව හෝ ජ්‍යෙෂ්ඨතාවය අහිමිකිරීමේ චේතනාවෙන්ම සිදුකළ බවට පෙත්සම්කරු කියා සිටින කරුණුද තහවුරු වන බවක් පෙනී යන්නේය. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ තම පෙත්සම ගොනුකර විභාගයට ගත් පසු 2017 වසරේදී පෙත්සම්කරු අත්අඩංගුවට ගෙන 2009 වසරේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් වෙනත් නිලධාරියෙකුට එරෙහිව ගොනුකළ නඩුවට එක් කරමින් බන්ධනාගාරගත කර ඇති අතර, පෙත්සම්කරු ඊට එරෙහිව දේශපාලන පලිගැනීම් පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ පෙත්සම දැනට විභාගයට ගෙන අවසන්ව පවතින බවද අනාවරණය වේ. පෙත්සම්කරුගේ උසස්වීමට අදාළ කරුණු තහවුරු කළ යුතු ලේඛන අස්ථානගත කර හෝ නොමැති බවට කරුණු දක්වා ඇත්තේ චේතනාන්විතවමද යන්න පිළිබඳ සැකයක් මතු වන්නේ එම ලේඛන නාවික හමුදාව සතුව තිබිය යුතු බවද පෙත්සම්කරු කියාපාමින් එකී ලේඛන හිටපු නාවික හමුදාපති මඟින් ගෙනහැර පාමින් පරීක්ෂණ දින ගොනුගත කරන බැවිනි.

ඒ අනුව එවැනි ක්‍රියාවන් සිදුවීම තුළින් නාවික හමුදාව සතුව එම ලේඛන නොමැති බවට කරනු ලබන ප්‍රකාශයක් සමඟ එකඟ විය නොහැක්කේ එවැනි වටිනා රහස්‍ය ලේඛන නොමැති හෝ අස්ථානගතව තිබේනම් ගන්නා ලද අභ්‍යන්තර පරීක්ෂණයක් හෝ තිබිය යුතුව වූ බැවිනි. ඒ අනුව තවදුරටත් පෙත්සම්කරුට එකී සහන ලබා ගැනීමට ඇති අයිතිවාසිකම්වලට එරෙහිව කටයුතු කිරීමෙන් පෙත්සම්කරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන පරිදි නාවික හමුදාවේ වගඋත්තරකරුවන් තම විධායක හා පරිපාලන කටයුතු සිදු කරමින් කටයුතු කර ඇති බව මින් නිගමනය කරනු ලැබේ.

**07. ඉහත කරුණු සලකා බැලීමේදී පෙත්සම්කරුට එරෙහිව වගඋත්තරකරුවන් කටයුතු කර ඇති ආකාරය පහත පරිදි බව නිගමනය කර දක්වමි.**

a). 2009 වසරේදී ත්‍රිවිධ හමුදා වෙනුවෙන් නිර්දේශිත උසස්වීම් සඳහා හිටපු නාවික හමුදාපති රියර් අද්මිරාල් W.K.J.කරන්නාගොඩ මහතා සහ නාවික හමුදා ප්‍රධානීන් විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ දැනුම්දීමට අනුව සකස් කර නම් කළ 71 දෙනෙකුගේ නාම ලේඛනයට පෙත්සම්කරුගේ නම ආසන්න උසස්වීම සඳහා නිර්දේශ ගතව තිබුණද එය ප්‍රදානය කිරීමට කටයුතු කර නැති බවද,

b). 2009 වසරේදී හිමිවිය යුතු ඉහත උසස්වීම අහිමිවීමෙන් ජ්‍යෙෂ්ඨතාවය සහ පසුකාලීන උසස්වීම් අවිධිමත් ලෙස පෙත්සම්කරුට හිමිව ඇති බවද,

c). 2013 වසරේදී සම්මුඛ පරීක්ෂණ වලදී රණවික්‍රම පදක්කම් සඳහා ලකුණු ලබාදීමේදී පෙත්සම්කරුට ලකුණු අහිමිකර වෙනස්කොට සැලකීමකට ලක්කර ඇති බවද,

d). උසස්වීමක් ලෙස හිමි කොමදෝරු නිලය නියමිත වර්ෂයට අදාලව ලබා නොදීම සහ දීර්ඝ කාලයක් එකී තනතුර ස්ථිර නොකිරීමෙන් ජ්‍යෙෂ්ඨතාවය පහත හෙලීම සිදුව ඇති බවද,

e). ඇමෙරිකා එක්සත් ජනපදයේ නාවික හා යුධ පුහුණු පාඨමාලාවක් සඳහා යාමට පෙර ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ පලමු තැනට තේරී පත්ව සිටි පෙත්සම්කරු 2015 වසරේදී ප්‍රකාශයක් ලබා ගැනීමට බව දක්වා යලි එකී පාඨමාලාව අතරමැද නවතා කැදවා ගත් පසු ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ 08 ස්ථානයට පහත හෙලීම සිදුව ඇති බවද,

f). උසස්වීම් සඳහා හිමිකම් තිබූ 2009 හා 2015 අතර වූ කාලයේ දී පෙත්සම්කරුට එරෙහිව කිසිදු අධිකරණයක නඩු කටයුත්තක් නොතිබියදී උසස්වීම් නිසි දිනට ලබා දී නොමැති බවද.

g). පෙත්සම්කරු එතෙක් හදාරමින් සිටි විදේශීය ශිෂ්‍යත්ව පාඨමාලාවට යාමට ඉඩනොදීම සහ නියමිත වෙනත් එවැනි පාඨමාලා සඳහා යාමට තිබූ අවස්ථා අහිමිකර ඇති බවද,

h). පෙත්සම්කරුට හිමි විය යුතු උසස්වීම් ලබාගැනීමට හැකිවන පරිදි නියමිත අවස්ථාවල අදාල තේරීම් මණ්ඩල පවත්වා නැති බවද,

i). පෙත්සම්කරුගේ අභියාචනා නොසලකා හැරීම සිදුකර ඇති බවද සහ පෙත්සම්කරුට සවන්දීමක් සිදු නොවූ බවද වගඋත්තරකරුගේ වාරතාවෙන් හා ඉදිරිපත් කල කරුණු අනුව පෙනී යන බවද,

j). උසස්වීම් තේරීම් මණ්ඩල විසින් ලකුණු ලබාදීමේදී පෙත්සම්කරුට අගතියක් වන පරිදි ලකුණු ලබා දී වෙනත් නිලධාරින් ජ්‍යෙෂ්ඨත්වයට පත්වන පරිදි කටයුතු කර තිබීමද , මේ පිළිබඳ ආරක්ෂක අමාත්‍යාංශය කමිටුවක් පත් කරමින් 2020 වසරේ කරුණු සොයා බලමින් තිබීමද යන කරුණු අනුව වගඋත්තරකරුවන් පෙත්සම්කරුට එරෙහිව තම විධායක පරිපාලන ක්‍රියාවන් සිදුකර ඇති බවට තහවුරු වේ.

නිර්දේශය :-

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ වූ III වන පරිච්ඡේදය 12 ව්‍යවස්ථාව හා 12 (1) හා 14(1)(2) ව්‍යවස්ථා උල්ලංඝනය කරමින් වගඋත්තරකරුවන් කටයුතු කර ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ. 2009 වසරේ සිට තවදුරටත් පෙත්සම්කරු දිගින් දිගටම එකී මූලික අයිතිවාසිකම් කඩවීමට ලක්වෙමින් තිබීම වළක්වා ගැනීම සඳහාද මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට පෙත්සම්කරු ලක්ව ඇති බැවින්ද පහත පරිදි කටයුතු කිරීමට මෙයින් දන්වා සිටිනු ලැබේ.

01. 2009 වසරේදී නිර්දේශිත ක්ෂේත්‍ර උසස්වීම පිළිබඳ කරුණු තහවුරු කර ගනිමින් එකී උසස්වීම ප්‍රදානය කර ඒ අනුව පසුව හිමිව ඇති උසස්වීම් නිවැරදි කිරීම.

02. කොමදෝරු නිලයට පත් කිරීමට පෙර ඊට අදාලව සිදුව ඇති අක්‍රමිකතාවයන් හා නියමිත වසරට අදාලව එම උසස්වීම ලබා දීමට පියවර ගෙන නොතිබීම පිළිබඳ පරීක්ෂා කර උසස්වීමට අදාලව කටයුතු කිරීමෙන් පසු සුදුසු ලෙස තනතුරු නාම ගැලපීමට පියවර ගැනීම.

03. ජ්‍යෙෂ්ඨතාවයේ පළමු ස්ථානයට පත්ව සිටි පෙත්සම්කරුට එකී ජ්‍යෙෂ්ඨතාවය අහිමිවීමට හේතු වූ කරුණු පරීක්ෂා කර එම අවස්ථාව අහිමි කළ වගඋත්තරකරුවන් වන නිලධාරීන්ට එරෙහිව නාවික හමුදා පනත ප්‍රකාරව නිසි නීතිමය පියවර ගැනීම සහ පෙත්සම්කරුට හිමිව තිබූ ජ්‍යෙෂ්ඨතාවය නිවැරදි කිරීම.

04. නිවැරදි ජ්‍යෙෂ්ඨතාවය මත පෙත්සම්කරුට හිමිවිය යුතු නිවැරදි තනතුර කුමක්ද යන්න පිළිබඳ පරීක්ෂා කර බලා කඩිනමින් එය හිමිකරදීමට අවශ්‍ය පියවර ගැනීම.

05. නිවැරදි ජ්‍යෙෂ්ඨතාවය මත හිමිවිය යුතු තනතුරට අදාළ සියලු වැටුප්, දීමනා සහ වෙනත් වරප්‍රසාද හිමිකර දීම.

06. නාවික හමුදා මූලස්ථානයේ ලේඛන අතුරුදහන්ව තිබීම පිළිබඳවද, තේරීම් මණ්ඩලයන්හිදී ලකුණු ලබා දීමේදී හිතාමතා චේතනාන්විතව කටයුතු කර ක්‍රියා කිරීමෙන් නාවික හමුදාවේ කීර්ති නාමයට හා විශ්වාසනීයභාවයට එරෙහිව කටයුතු කළ තැනැත්තන්ට එරෙහිව නාවික හමුදා පනත ප්‍රකාරව නිසි විනය පියවර ගැනීම.

07. 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ ආරක්ෂා කර ඇති මූලික අයිතිවාසිකම් පිළිබඳ 12 ව්‍යවස්ථාව 12 (1) ව්‍යවස්ථාව සහ 14 (1) (උ) ව්‍යවස්ථාව

උල්ලංඝනය කරමින් පෙත්සම්කරුට එරෙහිව කටයුතු කර ඇති බව මින් නිර්දේශ කරමින් පෙත්සම්කරු එලෙස මූලික අයිතිවාසිකම් කඩකිරීමකට ලක් කර තිබීම පිළිබඳ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ගනු ලබන වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බවටද මින් නිර්දේශ කරනු ලැබේ.

2021.01.18 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.